“දේවත්වය විශ්වාස කරන්නා හා දේවත්වය විශ්වාස කරන්නිය ඔහු හෝ ඇය මත, පාපයක් නොපිහිටන තත්ත්වයක අල්ලාහ්ව මුණ ගැසෙන තෙක්, තමන් තුළ ද තම දරුවන් තුළ ද තම සම්පත් තුළ ද පරීක්ෂාවට ලක්වෙමින්ම සිටියි

අල්ලාහ්ගේ දූතයාණන් (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) ප්රකාශ කළ බව අබූ හුරෙයිරා (රළියල්ලාහු අන්හු) තුමා විසින් මෙසේ වාර්තා කරන ලදී: “දේවත්වය විශ්වාස කරන්නා හා දේවත්වය විශ්වාස කරන්නිය ඔහු හෝ ඇය මත, පාපයක් නොපිහිටන තත්ත්වයක අල්ලාහ්ව මුණ ගැසෙන තෙක්, තමන් තුළ ද තම දරුවන් තුළ ද තම සම්පත් තුළ ද පරීක්ෂාවට ලක්වෙමින්ම
සිටියි."
[හසන් ගණයට අයත් හදීසයකි]

"දේවත්වය විශ්වාස කරන්නා හා දේවත්වය විශ්වාස කරන්නිය තුළ ශරීර සෞඛ්යතාවෙහි මෙන්ම ඔවුන්ගේ දරුවන් අතර විවිධ ලෙඩ රෝග, මරණ, හිංසන හා වෙනත් එවැනි පීඩාවන් ඇති වීම, ඔවුන්ගේ ධනයෙහි දිළිඳු බව ඇති වීම, ව්යාපාර කඩා වැටීම, සොරකමට ලක්වීම, ආහාර සම්පත්වල හිඟභාවය, මානසික අවපීඩනය සහ ජීවන සම්පත්හි අගහිඟකම් ඇතිවීම යනාදී පරීක්ෂණ හා විභාග ගැත්තාගෙන් අහකට යන්නේ නැත. එම පරීක්ෂණ හේතුවෙන් අල්ලාහ් ඔහුගේ සියලු පාපකම් හා වැරදි වලට සමාව දෙයි. එය කෙතරම් දුරටද යත් අල්ලාහ්ව ඔහු මුණ ගැසුණු විට ඔහු කළ සියලුම පාපකම් හා වැරදිවලින් ඔහු පිරිසිදු වනු ඇත." යයි නබි (සල්ලල්ලාහු අලෙයිහි සල්ලම්) තුමා දැන්වුහ .

https://sunnah.global/hadeeth/si/show/3159